**ශීර්ෂය - 288 මිනින්දෝරු දෙපාර්තමේන්තුව**

**----------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූලි 14 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 සැප්තැම්බර් 08 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට,

(ආ) මෙම වාර්තාවේ 1.6.1. (අ), (ආ), (ඇ), (ඈ), (ඉ), 1.6.5 සහ 1.6.6 ඡේදවල සඳහන් නිරීක්ෂණ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ වාර්තාවේ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.1 ඡේදය යටතේ මූල්‍ය ප්‍රකාශ - 2020 පිළියෙල කිරීමට අදාළව රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මැදවච්චිය, ඇඹිලිපිටිය, කරුන්චිකාඩු හා මාදම්පේ යන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සහ ගිරිතලේ නිල නිවස යන ගොඩනැගිලිවල ඉදිකිරීම් කටයුතු 2018 දෙසැම්බර් 31 දින වනවිට නිම වෙමින් පැවතුණු අතර, එදිනට රු. 9,764,046 ක් වූ නොනිමි වැඩ ශේෂය 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නොනිමි වැඩ යටතේ පෙන්වා තිබුණි. 2019 වර්ෂයේදී අදාළ ඉදිකිරීම්වල එකතුව රු.83,236,331 ක් වුවද, එම වටිනාකම 2019 සහ 2020 වර්ෂවල මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් ලෙස දක්වා නොතිබුණු අතර, 2018 වර්ෂයේ දක්වා ඇති ශේෂය වන රු. 9,764,046 එලෙසම සමාලෝචිත වර්ෂය අවසානයටද දක්වා තිබුණි. | දෙපාර්තමේන්තුවෙන් අදාළ වාර්තා ලබාගැනීම ප්‍රමාදවීම නිසා ගොඩනැගිලිවල පිරිවැය නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීම ප්‍රමාද විය. | ඉදිකිරීම් නිම කර ඇති ගොඩනැගිලිවල පිරිවැය මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | බදුල්ල සහ ගිරිතලේ ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල ගොඩනැගිලි 2019 වර්ෂයේදී ඉදි වෙමින් පැවතුණු අතර, 2019 දෙසැම්බර් 31 දින වනවිට එම වත්කම්වල රු. 36,770,240 ක් වූ නොනිමි වැඩ පිරිවැය 2020 වර්ෂයේ මූල්‍ය ප්රකාශනවල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය මගින් හෙළිදරව් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවෙන් අදාළ වාර්තා ලබාගැනීම ප්‍රමාදවීම නිසා නොනිමි වැඩවල පිරිවැය නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීම ප්‍රමාද විය. | වර්ෂ අවසානයට නොනිමි වැඩ ශේෂයන් මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කළ යුතු වීම. |
| (ඇ) | රු.මිලියන 13 ක වියදමින් පොළොන්නරු දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ඉදිකිරීම් කටයුතු 2017 වර්ෂයේ නිම කර ඇතත් 2017, 2018, 2019 සහ 2020 වර්ෂවල මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවෙන් අදාළ වාර්තා ලබාගැනීම ප්‍රමාදවීම නිසා ගොඩනැගිලිවල පිරිවැය නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීම ප්‍රමාද විය. | ඉදිකිරීම් නිමකර ඇති ගොඩනැගිලිවල පිරිවැය මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කළ යුතු වීම. |
| (ඈ) | 2017 වර්ෂයේදී ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයෙන් ඉඩම් බැංකු ව්‍යාපෘතිය යටතේ ලබා දී තිබුණු රු.මිලියන 37.83 ක ලැප්ටොප් පරිගණක, ඔප්ටිකල් කේබල් හා පිඹුරු පරිලෝකනය යන වත්කම් 2017, 2018, 2019 සහ 2020 වර්ෂවල මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණි. | ඉඩම් බැංකු ව්‍යාපෘතිය යටතේ ලද ලැප්ටොප් පරිගණක ගිණුම් ගත කරන ලෙස පළාත් කාර්යාල වෙත උපදෙස් දී ඇත. | වෙනත් ආයතනවලින් ලබාදුන් ප්‍රතිපාදන මත මිලදී ගෙන ඇති වත්කම් නිසි ලෙස ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කළ යුතු වීම. |
| (ඉ) | මධ්‍යම, උතුරුමැද, නැගෙනහිර හා වයඹ යන පළාත්වල දෙපාර්තමේන්තුවට අයිති හිස් ඉඩම් හෙක්ටයාර් 1.3139 ක්ද, අනුරාධපුරය සහ ගලේවෙල යන ස්ථානවල ගොඩනැගිලි ඉදිකළ ඉඩම් 02 ක්ද, බදුල්ල ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි නිල නිවස සහ අනුරාධපුරය පෙරසවි කඳවුර ඇතුළු දකුණු පළාතේ තවත් ගොඩනැගිලි 02 ක්ද සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම තක්සේරු කොට ගිණුම්ගත කර නොතිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව මගින් සියලුම ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කිරීම සඳහා පළාත් සර්වේයර් ජනරාල්වරුන් දැනුවත් කර ඇති අතර, අදාළ තොරතුරු සියල්ල ඇතුළත් කිරීම සඳහා පරිගණක තොරතුරු පද්ධතියක් ද සකස් කර ඇත. | ආයතනය සතු වත්කම් තක්සේරු කොට ගිණුම්ගත කළ යුතු වීම. |

## 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

දේපළ පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) මූල්‍ය නොවන වත්කම්වල පසුගිය වර්ෂය අවසානයේ පැවති ශේෂය සදොස් ලෙස සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස ඉදිරියට ගෙන ඒම නිසා රු.84,446,460 ක පැහැදිලි නොකළ වෙනස්කම් නිරීක්ෂණය විය. | මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීමේදී දැනට පවතින වත්කම් තක්සේරු කර නව සිගාස් පරිගණක පද්ධතියට ඇතුළත් කිරීමේදී ආරම්භක ශේෂ ලෙස ඇතුළත් කිරීමට සිදු වේ. එබැවින් දැනට පවතින වත්කම් සියල්ල ගිණුම්ගත කර අවසන් වනතුරු පෙර වසරේ අවසන් ශේෂය හා ඉදිරි වසරේ ආරම්භක ශේෂය අතර වෙනසක් ඇති වේ. | මූල්‍ය ප්‍රකාශනවල තොරතුරු නිවැරදිව හෙළිදරව් කළ යුතු වීම. |
| (ආ) 2012 වර්ෂයේ මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ මෙම දෙපාර්තමේන්තුවට ලබාගෙන මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණු මෝටර් රථ දෙකක කල්බදු කාලසීමාව ඉක්මවීමටත් පෙර එනම්, 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත භාවිතය සඳහා ලබාදී තිබුණි. | කොවිඩ් තත්ත්වය යටතේ තොරතුරු පිළියෙල කිරීමට ප්‍රමාද වූ බැවින් ඉක්මනින් පිළිතුරු ලබාදීමට කටයුතු කරමි. | මෝටර් රථ ආපසු ලබා ගැනීමට හෝ නීත්‍යානුකූලව පවරා දීමට කටයුතු කළ යුතු වීම. |

## 1.6.3 තැන්පතු

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ තැන්පත් ගෙවීම් හා ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් පිළිබඳ ප්‍රකාශයේ ශේෂ සහ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහනේ ශේෂ අතර රු.47,069 ක පැහැදිලි නොකළ වෙනසක් නිරීක්ෂණය විය. | 2015 වර්ෂයේ අංක 6000-0000-00-0015-0143 දරන පොදු තැන්පත් ගිණුම ශුන්‍ය කර වසා දමන ලද නමුත්, ඇතැම් පළාත් කාර්යාල විසින් එම ගිණුම ශුන්‍ය කර නොමැති අතර, මේ හේතුවෙන් භාණ්ඩාගාර පොත් සහ දෙපාර්තමේන්තු පොත් අතර, මෙම වෙනස පවතී. | වෙනස්කම් හඳුනාගෙන අවශ්‍ය නිවැරදි කිරීම් කළ යුතු වීම. |

## 1.6.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත සඳහන් වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් බී ගිණුමේ වයස් විශ්ලේෂණයේ එකතුව හා කේවල ශේෂ එකතුව අතර රු.766,064 ක හඳුනා නොගත් වෙනසක් නිරීක්ෂණය විය. | නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. | වෙනස්කම් හඳුනාගෙන අවශ්‍ය නිවැරදි කිරීම් කළ යුතු වීම. |
| (ආ) කේවල ශේෂ එකතුව හා දෙපාර්තමේන්තු පාලන ගිණුම් ශේෂය අතර රු.200,450 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම වෙනසට හේතූන් සොයා බලා ඉදිරියේදී අවශ්‍ය වන ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. | වෙනස්කම් හඳුනාගෙන අවශ්‍ය නිවැරදි කිරීම් කළ යුතු වීම. |

## 1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ලේඛනය පවත්වා නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් මු.රෙ. 891(i) ප්‍රකාරව මුදල් කටයුතු භාර නිලධාරීන් වෙනුවෙන් ඇප ලේඛනයක් පවත්වා නොතිබුණි. | මු.රෙ. 891(i) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හඳුනා ගෙන ඇප ලේඛනයක් තබා ගැනීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප ලේඛනයක් තබා ගත යුතු වීම. |

### 1.6.6 විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි, ස්ථාන සියයක පිහිටි රු.මි. 5,689 ක් ලෙස අගයකර ගිණුම්ගත කර ඇති හෙක්ටයාර් 49.477 ක ඉඩම්වල අයිතිය තහවුරු කිරීම සඳහා ඔප්පු, පිඹුරු සහ ඉඩම් ලබාදීමේ සහතික සහ දිවයිනේ විවිධ ප්‍රදේශවල ස්ථාන 76 ක පිහිටි රු.මි. 1,009 ක් ලෙස අගය කර ඇති වර්ග අඩි 666,737 ක දෙපාර්තමේන්තු ගොඩනැගිලිවල නීත්‍යානුකූල අයිතිය තහවුරු කිරීමට එම ගොඩනැගිලි ඉදිකළ භූමිභාගවල ඔප්පු සමාලෝචිත වර්ෂයේදීද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | නිසි පරිදි ලේඛන ගත කිරීම මේ වන විටත් ආරම්භ කර ඇත. සියලුම ඉඩම් හා ගොඩනැගිලිවලට අදාළ තොරතුරු ඇතුළත් කිරීම සඳහා පරිගණක තොරතුරු පද්ධතියක් ද සකස් කර ඇත. | වත්කම්වල නීත්‍යානුකූල අයිතිය තහවුරු කිරීමට අදාළ ලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූලධන වැය විෂයයන් පහකට අදාළව ප්‍රතිපාදනය කර තිබුණු එකතුව රු.19,969,466 ක් ඉතිරිව තිබුණු අතර, ඒ තුළ සියයට 54 සිට සියයට 99 දක්වා පරාසයක ඉතිරිවීම් තිබුණි. | 2020 වර්ෂයේ පැවති කොරෝනා වසංගත ව්‍යාප්තිය හේතුවෙන් අපේක්ෂිත ඉදිකිරීම් හා අලුත්වැඩියා කටයුතු සම්පූර්ණ කරගත නොහැකි වීම, මූලධන වත්කම් නියමිත දිනට සැපයීමට අදාළ සැපයුම්කරුවන් අපොහොසත් වීම, පුහුණු පාඨමාලා පැවැත්වීමට නොහැකි වීම යනාදිය හේතුවෙන් මූලධන වැය විෂයන්වල ඉතිරිවීම් සිදු විය. | ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය කළ යුතු වීම. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ වැය විෂයයන් අටක එකතුව රු.4,944,336 ක්වූ ඉතිරිවීම් තිබුණු නමුත්, එම වැය විෂයයන් යටතේ එළඹ තිබුණු බැරකම් ප්‍රමාණය රු.20,791,007 ක් වූ බැවින් ඉතිරිය ඉක්මවූ බැරකම්වල එකතුව රු.15,846,671 ක් විය. | විගණන නිරීක්ෂණය හා එකඟ වෙමි. ඉදිරියේදී පවතින ප්‍රතිපාදන ප්‍රමාණය මත පදනම්ව බැරකම් සඳහා එළඹීමට කටයුතු කරමි. | ප්‍රතිපාදන ඉතිරිවීම් ඉක්මවා බැරකම්වලට එළඹීමට කටයුතු නොකළ යුතු වීම. |

## 2.3 තැන්පත් ශේෂයන්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පොදු තැන්පත් ගිණුමේ පවතින වර්ෂ 02 ත් 05 ත් අතර රු.1,969,062 ක් හා වර්ෂ 1 ත් 2 ත් අතර රු.1,906,956 ක් වූ ශේෂ මු.රෙ. 571(3) ප්‍රකාරව ක්‍රියාකර ආපසු ගෙවීමට හෝ රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ තැන්පතු ගෙවිය යුතු අය සහ ආයතන සම්බන්ධ කර ගත නොහැකි වීම, මුදල් තැන්පත් කළ බව සහතික කිරීමට අදාළ කුවිතාන්සි ඉදිරිපත් නොකිරීම, බලයලත් මිනින්දෝරුවරුන් වෙත නිකුත් කර ඇති මැනුම් ඉල්ලීම් මේ වන තෙක් වැඩ නිමකර භාර දී නොමැති බැවින් අදාළ ඇප තැන්පතු මුදල් ආපසු ගෙවීමට නොහැකි වීම යන හේතු මත පොදු තැන්පත් ගිණුමේ වර්ෂ 01ත් 05ත් අතර ශේෂ පවතී. මු.රෙ. 571 (3) ප්‍රකාරව ක්‍රියාකර ආපසු ගෙවිමට හෝ රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරමි. | මු.රෙ. 571(3) ප්‍රකාරව ක්‍රියාකර ආපසු ගෙවීමට හෝ රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මොනරාගල ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ ජීප් රථයක් 2016 අගෝස්තු සිටත්, ට්‍රේලරය සහිත ට්‍රැක්ටරය 2008 වර්ෂයේ සිටත් ගර්හිත කිරීමට හා අපහරණය කිරීමට ඌව පළාත් සභාවේ යාන්ත්‍රික ඉංජිනේරුවරයා විසින් නිර්දේශ කර තිබුණත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාද ඒ අනුව කටයුතු කිරීමට අපොහොසත් වී තිබුණි. | පැවති කොවිඩ් වසංගත තත්ත්වය මෙම කාර්යයන් නිම කිරීම ප්‍රමාද කිරීමට සෘජුවම බලපෑ අතර 2021 දී අවසන් කිරීමට හැකිවෙතැයි බලාපොරොත්තු වේ. | ගර්හිත කිරීමට හා අපහරණය කිරීමට ඌව පළාත් සභාවේ යාන්ත්‍රික ඉංජිනේරුවරයා විසින් කර තිබූ නිර්දේශ පිළිබඳව සලකා බැලිය යුතු වීම. |
| (ආ) | බිම් සවිය ප්‍රතිපාදන මඟින් රු.මිලියන 312 ක් වැයකර මිලදී ගන්නා ලද මැනුම් උපකරණ ඇතුළු විවිධ ප්‍රාග්ධන වත්කම් හා රු.මිලියන 82 ක් වැය කර ඉදිකරන ලද ගොඩනැගිලි ඉඩම් අමාත්‍යාංශයෙන් පවරා ගැනීමකින් තොරව පරිහරණය කරමින් පැවතුණි. | බිම් සවිය ප්‍රතිපාදන මගින් මිලදී ගන්නා ලද ප්‍රාග්ධන වත්කම් පවරා ගැනීම සඳහා ඉදිරියේදී කටයුතු කරමි. | වත්කම්වල නීත්‍යානුකූල අයිතිය ලබා ගැනීම සඳහා එම වත්කම් විධිමත්ව පවරා ගත යුතු වීම. |

### 3.2 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පාඩු හා හානි ගිණුමේ සමාලෝචිත වර්ෂය අවසානයට කපා නොහළ ඉදිරියට ගෙන ආ ශේෂවල වටිනාකම රු.7,580,614 ක් වූ අතර ඒ තුළ තිබූ වසර පහත් තිස් එකත් අතර පරාසයක වූ පාඩු හා හානිවල වටිනාකම රු.2,753,891 ක් විය. | කොවිඩ් තත්ත්වය යටතේ තොරතුරු පිළියෙල කිරීමට ප්‍රමාද වූ බැවින් ඉක්මනින් පිළිතුරු ලබාදීමට කටයුතු කරමි. | පාඩු හා හානි නොපමාව පොත්වලින් කපා හළ යුතු වීම. |

## 3.3 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) මිනින්දෝරු දෙපාර්තමේන්තු පරිශ්‍රයේ සවිකර ඇති සියලුම ගිනි නිවීමේ උපකරණවල සක්‍රීය කාලය 2020 ජූලි 25 දිනෙන් අවසන් වී ඇති නමුත්, ඒවා අලුත් කිරීමට 2021 අප්‍රේල් 30 දින දක්වාත් අපොහොසත් වී තිබුණි. | ගිනිගැනීම් හඳුනාගැනීමේ පද්ධතිය පරීක්ෂා කර එය නැවත සකස් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. 2020 වර්ෂයේදී රටතුළ පැවති වාතාවරණය නිසා සක්‍රිය තත්ත්වයට පත්කිරීම සිදුකළ නොහැකි වුවද කොටසක් මේ වනවිට යථාවත් කර ඇත. ඉතිරි කොටස් ඉදිරියේදී යථාවත් කිරීමට කටයුතු යොදා ඇත. | නොපමාව ගිනි නිවීමේ උපකරණ සක්‍රීය කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග ix පරිච්ඡේදයේ 9.1 වගන්තිය අනුව ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ වටිනාම සම්පත් ලෙස ආරක්ෂා කළ යුතුව පැවති විමර්ශන ලේඛනාගාරයේ හා මධ්‍යම ලේඛනාගාරයේ පවතින පහත සඳහන් අඩුපාඩුකම් සකස් කිරීම සඳහා කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි.<br>(i) වායු විසරණ විදුලි පංකා හා අවශෝෂක විදුලි පංකා සවිකිරීම.<br>(ii) මධ්‍යගත වායු සමීකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම.<br>(iii) අතිරේක රාක්ක සැපයීම.<br>(iv) අබලන්ව ඇති පරිලෝකන අංශයේ වහල අලුත්වැඩියා කිරීම.<br>(v) ගැලවී ගරා වැටී ඇති බිත්ති කොටස් අලුත්වැඩියා කිරීම.<br>(vi) වැසිකිළි පද්ධතියේ ජල කාන්දුව අලුත්වැඩියාව.<br>(vii) සිතියම් තැන්පත් කිරීම සඳහා ලාච්චු සහිත සිතියම් කැබිනට් සපයා දීම. | ලේඛනාගාරයේ ඇති පිඹුරු මුල් පිටපත් පමණක් වෙන්කර සංරක්ෂණය කිරීමට, වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීමට ටෙන්ඩර් කැඳවීමට, නව රාක්ක පිළියෙල කිරීමට, ආදී වශයෙන් 2021 වර්ෂයේදී කටයුතු කරනු ඇත. | දෙපාර්තමේන්තුවේ සම්පත් රැකගැනීම සඳහා වැඩපිළිවෙලක් සැකසීමට හා පවතින අඩුපාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කැස්බෑව ප්‍රාදේශීය කාර්යාලය, මොනරාගල ප්‍රාදේශීය කාර්යාලය හා තණමල්විල ප්‍රාදේශීය කාර්යාලවල මායිම් ගල් නිපදවීමේදී රජයේ මායිම් ගල් අඥාපනතේ 4.15 ට අනුව මිනින්දෝරු අධිකාරිගේ අධීක්ෂණය යටතේ කටයුතු කිරීම, 4.16 ට අනුව අදාළ වියදම් විස්තර ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරිට දන්වා යැවීම, 4.19 ට අනුව මායිම් ගල් සියයේ ඒකක වශයෙන් ගොඩ ගැසීම, 4.39 (ආ) ට අනුව මායිම් ගල් ලෙජරය පවත්වාගෙන යාම, 4.43 ට අනුව මායිම් ගල් කැඩී යාම අවම කර ගැනීමට හා 4.44 හා 4.45 ට අනුව අලාභ අයකර ගැනීමට කටයුතු කිරීම යන කාර්යයන් ඉටු කර නොතිබුණි. | ඉදිරියේදී පිළිතුරු දීමට කටයුතු කරමි. | මායිම් ගල් අඥාපනතේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | 2020 දෙසැම්බර් 31 දිනට නිම කිරීමට අපොහොසත් වී තිබුණු මැනුම් නියෝග සංඛ්‍යාව 29,105 ක් වූ අතර, ඒ තුළ 2015 වර්ෂයට පෙර සිට 2019 වර්ෂය අවසානය දක්වා නිම කිරීමට නොහැකි වී තිබුණු මැනුම් නියෝග 27,932 ක්ද විය. | වාර්ෂිකව මැනුම් ඉල්ලීම් විශාල සංඛ්‍යාවක් ලැබෙන බැවින් විශේෂ මැනුම් ඉල්ලීම්වලට හා උසාවි නියෝගවලට ප්‍රමුඛත්වයක් දී කටයුතු කරයි. වැඩ ප්‍රමාණ සංශෝධන හේතුවෙන් නිමැවුම ඉහළ නැංවීම නිසා යම් වැඩිපුර ප්‍රමාණයක් නිම කිරීමට අපේක්ෂිතයි. | උසාවි මැනුම් නියෝග ඇතුළු හිඟ හිටව ඇති මැනුම් නියෝග ප්‍රමාණය නිම කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු වීම. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානය වන විට රජයේ නිලධාරීන්ට අත්තිකාරම් බී ගිණුමේ හිඟහිටි ණය ශේෂවල එකතුව රු.10,635,305 ක් වූ අතර, ඒ තුළ එකතුව රු.3,710,891 ක්වූ වර්ෂ 05 ඉක්මවූ ශේෂයන් නිරීක්ෂණය විය. | වර්ෂ 05 ඉක්මවූ ණය ශේෂවලින් කොටසක් කපා හැරීමට අනුමැතිය ලැබී ඇත. 2021 වර්ෂයේදී ඒ සඳහා ඉල්ලුම් කර ඇති ප්‍රතිපාදන ලද පසු කපා හැරීමට කටයුතු කරමි. ඉතිරි ණය ශේෂ අය කර ගැනීමට හෝ කපා හැරීමේ ප්‍රගතිය මාසිකව ඉදිරිපත් කරන ලෙස සියලුම ගණකාධිකාරීවරුන් දැනුවත් කර ඇත. එම ප්‍රගතිය පරීක්ෂා කිරීමෙන් පසු තවදුරටත් අය කර ගත නොහැකි ණය ශේෂ කපා හැරීමට අදාළ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. | කාලීනව ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයට සාපේක්ෂව ජ්‍යෙෂ්ඨ මට්ටමේ කාර්ය මණ්ඩල පුරප්පාඩු සියයට 17 ක්, තෘතීයික මට්ටමේ කාර්ය මණ්ඩල පුරප්පාඩු සියයට 58 ක්, ද්විතීයික මට්ටමේ කාර්ය මණ්ඩල පුරප්පාඩු සියයට 18 ක් හා ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩල පුරප්පාඩු සියයට 23 ක් වශයෙන් සමස්ත කාර්ය මණ්ඩල පුරප්පාඩු 116 ක් පැවතුණි. අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 22 ක් වූ මෙම පුරප්පාඩු පිරවීමට නොහැකි වීම හේතුවෙන් කළමනාකරණ තීරණ ගැනීමේදී මෙන්ම අරමුණුගත ප්‍රධාන කාර්යයන් ඉටු කරගැනීමේදීද එය බාධාකාරී ලෙස බලපෑ හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය. | ආධුනික මිනින්දෝරු තනතුරු 128 න් 115 ක් බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලද අනුමැතිය අනුව 2021 පෙබරවාරි 28 දින පැවැත්වූ විභාගයේ ප්‍රතිඵල ලැබීමට නියමිත අතර, අනෙකුත් තනතුරු 13 සඳහා සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවීමට නියමිතය. 2016 සැප්තැම්බර් 08 දින සිට 2019 පෙබරවාරි 15 දින දක්වා ඇතිවූ කාර්මික හා පරිපාලන නිලධාරි පුරප්පාඩු 10 න් 06 ක් බඳවා ගත් අතර, සීමිත පදනමින් 4 ක් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවීමේ නිවේදනය අත්සන සඳහා අමාත්‍යාංශය වෙත යවා ඇත. ජ්‍යෙෂ්ඨ පිඹුරු වර්ණ තාක්ෂණ නිලධාරි පුරප්පාඩුව සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා නිර්දේශ කර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යවා ඇත. ජ්‍යෙෂ්ඨ සිතියම් තාක්ෂණ නිලධාරි තනතුරු 14 ක් සඳහා කුසලතා පදනම යටතේ සම්මුඛ පරීක්ෂණ පවත්වා, ඉන් 10 කට 2017දෙසැම්බර් 31 දිනටද, 04 කට 2018 දෙසැම්බර් 31 දිනටද උසස් වීම් ලබා දීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත නිර්දේශ යවා ඇත. 2017 පුරප්පාඩු 06 ක් සඳහා සීමිත පදනමට සම්මුඛ පරීක්ෂණ පවත්වා 2019 මාර්තු 24 දින සිට උසස්වීම ලබා දීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත නිර්දේශ යවා ඇත. මැනුම් ක්ෂේත්‍ර සහායක තනතුරු 150 ක් සඳහා විභාගය පැවැත්වීමට මැයි 23 දිනට තීරණය කර තිබුණද කොවිඩ් තත්ත්වය නිසා කල් දැමීමට සිදුව ඇත. | අවශ්‍යතා සැලකිල්ලට ගෙන පවතින තනතුරු පුරප්පාඩු කඩිනමින් පුරවා ගැනීමට හෝ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කරගැනීමට පියවර ගත යුතු වීම. |